**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - 2020**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ  පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව  ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 66 වන ඡේදය ප්‍රකාරව මාස 12 ක් ඇතුළත ලැබිය යුතු සේවක ණය මුදල් ජංගම වත්කම් ලෙසත්, මාස 12 කට වැඩි කාලයකින් පසුව අයවීමට ඇති වටිනාකම් ජංගම නොවන වත්කම් ලෙසත්, වර්ගීකරණය කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් කළ යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.19,532,289 ක් වූ සේවක ණය වර්ගීකරණය කිරීමකින් තොරව ජංගම වත්කම් ලෙස සටහන් කර තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ ගැළපීම් සිදු කරමි. | මෙම ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 69 වන ඡේදය ප්‍රකාරව සේවක පාරිතෝෂික වෙන් කිරීමේදී ඉදිරි මාස 12 ක කාලය තුළ ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකම ජංගම වගකීම් ලෙසත්, ඉතිරි පාරිතෝෂික | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ ගැළපීම් සිදු කරමි. | මෙම ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගෙවීම් වටිනාකම ජංගම නොවන වගකීම් ලෙසත් පෙන්විය යුතු වුවත්, එසේ වර්ගීකරණයකින් තොරව මුළු වෙන් කිරීම වන එකතුව රු.51,335,633 ක වටිනාකම ජංගම නොවන වගකීම් ලෙස සටහන් කර තිබුණි. | | |
| (ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු අගයන් සහ මූල්‍ය වගකීම් වෙන් වෙන්ව පෙන්විය යුතු වුවත්, සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ එකතුව රු.51,097,862 ක් වූ මූල්‍ය වගකීම් වන උපචිත වියදම් වෙනත් ණයහිමියන් යටතේ සටහන් කර තිබුණි. | 2021 වර්ෂයේදී ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 54 ඡේදය ප්‍රකාරව ප්‍රතිපාදන වෙන්කිරීම් හා ගෙවිය යුතු බදු මුදල් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ වෙනම හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථාව විසින් ගෙවිය යුතු එකතු කළ අගය මත බදු එකතුව රු.152,612 ක් සහ උපයන විට ගෙවීම් බදු එකතුව රු.38,253 ක් හා විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන එකතුව රු.5,125,000 ක් වෙනත් ණයහිමියන් යටතේ සටහන් කර මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කරනු ලැබේ. | මෙම ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 07 වන ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර බිල්පත් හා ප්‍රති විකුණුම් බිල්පත් ගිණුම්ගත කිරීමේදී 2020 දෙසැම්බර් 31 දිනට කල් පිරීමට ඉතිරිව ඇති කාලය මාස 03 හෝ ඊට අඩු ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන ද්‍රවශීල වත්කම් ලෙස පෙන්නුම් කළ යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දිනට මාස තුනක කාලයක් තුළදී කල් පිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් 26 ක එකතු වටිනාකම වූ රු.118,997,660 ක් හා භාණ්ඩාගාර බිල්පත් ප්‍රති විකුණුම් (Repo) 11 ක එකතු වටිනාකම වූ රු.108,680,741.10 ක් මුදල් හා මුදල් | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ ගැළපීම් සිදු කරමි. | මෙම ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සමාන ද්‍රවශීල වත්කම් යටතේ දක්වා නොතිබුණි. | | |
| (ඊ) 2020 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී සත්‍ය මුදල් ගලා ඒම් සහ සත්‍ය මුදල් ගලායාම් පදනම් කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීම සිදු කළ යුතු වේ. එහෙත් සංස්ථාවේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඒ අනුව සකස් කර නොතිබුණි. තවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී මහාභාණ්ඩාගාර ලැබීම් තුළින් ජනනය වූ එකතුව රු.105,000,000 ක මුදල් ප්‍රවාහය, මූල්‍යන ක්‍රියාකාරකම් යටතේ වූ මුදල් ප්‍රවාහයක් ලෙස දැක්විය යුතු වුවත්, එය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වූ මුදල් ප්‍රවාහයක් ලෙස සටහන් කර තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | පිළිතුර ප්‍රකාරව නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කළ යුතුය. |
| (උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 79 (අ) ඡේදය ප්‍රකාරව නිශ්කාර්යා වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ පොත් අගයට හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථා පරිශ්‍රය තුළ හා ඉන් පිටත සංස්ථාවට අයත් ගොඩනැගිලි තුළ පවතින නිශ්කාර්යා වත්කම් හා යල් පැන ගිය පැරණි වත්කම් පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ ගැළපීම් සිදු කරමි. | මෙම ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 ප්‍රකාරව, නිශ්චිත කාලයකට වරක් වත්කම්වල හානිකරණ තත්ත්වයන් පෙන්නුම් කරයි නම් වත්කම්වල පොත්වල අගය හා වෙළඳපොල අගය සන්සන්දනය කර පොත්වල අගය වෙළඳපොල අගයට වඩා අඩු නම් එම වෙනස් ප්‍රමාණය කපා හැරීම සිදු කළ යුතු වුවත්, එවැනි අගය සන්සන්දනය කිරීමක් හෝ ගැළපීමක් සිදු කර නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ ගැළපීම් සිදු කරමි. | මෙම ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 ප්‍රකාරව ඇති විය හැකි අසම්භාව්‍ය වගකීම් සම්බන්ධව සහ නඩු පරීක්ෂණ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට සහ ඒ සඳහා වන වෙන් කිරීම් කිරීම් පිළිබඳව හෙළිදරව් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන දිනට විවිධ අධිකරණවල විභාග වෙමින් පවතින සංස්ථාව විත්තිකරු වූ නඩු කටයුතු 09 ක් ද, කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික ආරවුල් පනත යටතේ පවතින පරීක්ෂණ 05 ක් ද, මානව හිමිකම් කොමිෂන් සභාවේ පවතික පරීක්ෂණ 09 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ ගැළපීම් සිදු කරමි. | මෙම ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38 හි 68 (අ) ඡේදය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය වියදමක් ලෙස හඳුනා නොගත යුතු අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ස්ථාවර වත්කම් යටතේ දිගුකාලීන වත්කමක් ලෙස හඳුනා ගැනීමෙන් අනතුරුව ඒවායේ ඵලදායී ජීව කාලය තක්සේරු කර, වාර්ෂිකව ක්‍රමක්ෂය සිදුකර ඒ අනුව ආදායම් ප්‍රකාශනයට වියදම හඳුනාගත යුතු වුවත්, එකතුව රු.6,587,305 ක් වූ අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේදී අස්පෘශ්‍ය වත්කම් වාර්ෂිකව ක්‍රමක්ෂය සිදු කර ගිණුම් තුළින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම ප්‍රමිතය ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ. |
| (ඔ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38 හි ඡේද අංක 118 සහ 126 වන වගන්ති ප්‍රකාරව පරිගණක මෘදුකාංග පද්ධතියේ ඵලදායී ජීව කාලය, ක්ෂය කිරීමේ පදනම සහ පර්යේෂණ හා සංවර්ධන වියදම පිළිබඳව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2021 මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ප්‍රමිත අංක 38 ට අනුව අස්පෘශ්‍ය වත්කම් (පර්යේෂණ හා සංවර්ධන වැය) ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම ප්‍රමිතය හා පිළිතුර ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව සතුව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යනු ලැබුවද, ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් සංස්ථාව වෙත ලැබී පවරාගත් වාහන 06 ක් තක්සේරු කර වත්කම් ලේඛනයේ සටහන් කිරීම සහ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සංස්ථාව නමින් ලියාපදිංචි කර තිබුණද, වටිනාකම තක්සේරු කර නොමැති හෙයින් ඉදිරියේදී තක්සේරු කර වත්කම් ලේඛනගත කරනු ලැබේ. | තක්සේරු කර නොමැති වාහන තක්සේරු කර වත්කම් ලේඛනය යාවත්කාලීන කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| චිත්‍රපට කුළී ණයගැතියෝ | 362,737,356 | 381,558,535 | 18,821,179 | නිරීක්ෂණය නිවැරදි වේ. ඉදිරියේදී වෙනසට හේතු සොයාගෙන නිවැරදි කරමි. | පිළිතුර ප්‍රකාරව නිවැරදි කළ යුතුය. |

### 1.5.4. සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ ආදායම් වියදම පියවා ගැනීමට ප්‍රමාණවත් නොවීම මත 2011 වර්ෂයේ සිට මහාභාණ්ඩාගාරයෙන් සේවක වැටුප් හා ප්‍රාග්ධන වැය සඳහා ප්‍රතිපාදන සලසාදී තිබුණි. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 ක කාලය තුළ සංස්ථාව භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර දිගින් දිගටම මෙහෙයුම් අලාභ ලබන තත්ත්වයක් නිරීක්ෂණය විය. වර්තමානය වන විට රජයේ මූල්‍ය සහයක් හෝ චිත්‍රපට බෙදාහැරීමේ සහ ක්ෂේත්‍ර නියාමන බලතල සංස්ථාව වෙත ලබා ගැනීමේ නීතිමය කටයුතු සාක්ෂාත් කර ගැනීමකින් හෝ තොරව සංස්ථාව අඛන්ඩව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය විය. | 1999 වර්ෂයෙන් පසුව සංස්ථාවේ ප්‍රධාන ආදායම් මාර්ගය වූ බෙදාහැරීමේ කොමිස් මුදල අහිමි වීම මත සංස්ථාවේ වියදම් පියවා ගැනීමට 2001 වසරේ සිටම මහාභාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා ගැනීමට සිදු විය. | සංස්ථාවේ ආදායම් වැඩිදියුණු කර ගැනීමටත්, සංස්ථාවේ පැවැත්ම පිළිබඳ ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමටත්, පනත ප්‍රකාරව වූ කාර්යයන් ඉටු කිරීමටත් ක්‍රියා කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ | | | |
| (i) මුදල් රෙගුලාසි 103(ආ) සහ 104(1)(අ) | මෙම මුදල් රෙගුලාසි ප්‍රකාර වූ හදිසි අනතුරු වලට අදාළව හානි පාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර, රිය අනතුරු වලට අදාළව පොලීසියේ පැමිණිලි සටහන් කර මුදල් රෙගුලාසි අනුව අදාළ පරීක්ෂණ සිදු කර නොතිබුණි. වාහන අනතුරු ලිපිගොණුද ක්‍රමවත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි. | වාහන අනතුරු පිළිබඳව හානි පාඩු ලේඛනයක සටහන් කිරීමට කටයුතු කර ඇත. සුළු අනතුරු සම්බන්ධයෙන් රක්ෂණ ආයතනය දැනුවත් කර වන්දි ලබා ගැනීමට පියවර ගනු ලැබේ. රිය අනතුරු සම්බන්ධයෙන් ආයතන මට්ටමෙන් පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරනු ඇත. | මෙම මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 502 (2) සහ 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ ඡේද අංක 2(ආ), (ඉ) | මෙම මුදල් රෙගුලාසිය හා චක්‍රලේඛය ප්‍රකාරව සංස්ථාව සතු ස්ථාවර වත්කම් වෙනුවෙන් දෙපාර්තමේන්තුමය අංක ඇතුළත් ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර පවත්වාගෙන යනු ලැබේ. එය තවදුරටත් යාවත්කාලීන කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | මුදල් රෙගුලාසි 502 (2) සහ 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ ඡේද අංක 2(ආ), (ඉ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ඡේද අංක 11 | සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව එකතුව රු.619,640,309 ක් වූ ස්ථාවර වත්කම් වලට අදාළව 2020 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තා 2021 ඔක්තෝම්බර් මස දක්වා විගණනය වෙත ඉදිරිපත් නොකරන ලදී. | 2020 ජනවාරි 06 දින 2020 වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල පත් කර ඇත. පාලනාධිකාරියේ ඇති වූ වෙනස්කම් නිසා මෙම කටයුත්ත ප්‍රමාද විය. | 2020 වර්ෂය සඳහා වන සමීක්ෂණ මණ්ඩල වාර්තා 2021 නොවැම්බර් 10 දින දක්වා විගණනයට ඉදිරිපත් කර නොමැති අතර, සමීක්ෂණ කටයුතු අවසන් කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන සහ 2009 ජූනි 17 දිනැති අංක 09/2009 (I) දරන රාජ්‍ය පරිපාලන | මෙම චක්‍රලේඛ වලට අනුකූල වන ලෙස, සේවයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකර, සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ | වැඩබැලීමේ හා රාජකාරී ඉටු කිරීමට පත් කිරීම පිළිබඳව විමර්ශණයක් සිදු කිරීමට 2021 අප්‍රේල් 20 දින පැවති 1199 වැනි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ තීරණය | මෙම ගෙවීම් පිළිබඳව සහ සේවයට වාර්තා කිරීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා නොකිරීම පිළිබඳව සොයා බලා පිළිතුරු |

| | | | |
|---|---|---|---|
| චක්‍රලේඛය | කළමනාකරණ තනතුරු 03 ක් දරන ලද නිලධාරීන් සඳහා වැටුප් හා දීමනා ලෙස එකතුව රු.3,098,046 ක් ගෙවීම් කර තිබුණි. | කර ඇත. මෙම නිරීක්ෂණය නිවැරදි වන අතර, මේ පිළිබඳව සොයා බැලීමට අමාත්‍යාංශ ලේකම්වරයා වෙතද ඉල්ලීමක් සිදු කර ඇත. | ප්‍රකාරව අවශ්‍ය හා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම යෝග්‍ය වේ. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 වගන්තිය | මෙම වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම හා අයවැය ලේඛනය තත්‍ය කාර්ය සාධන දත්ත සමඟ කාලානුරූපීව සමාලෝචනය කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදීම ප්‍රගතිය විමසීමක් හා සමාලෝචනයක් සිදු කරයි. කෙසේ වුවද, මෙම කරුණ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමට නියමිතය. | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 වගන්තිය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

### 1.7. තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේදී ගිණුම් තැබීම පරිගණක මඟින් සිදු කිරීම සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව "ක්වික් බුක්" (Quick Book) මෘදුකාංග පද්ධතිය සංස්ථාව විසින් මිලදී ගෙන තිබුණි. ආයතනය තුළ තොරතුරු තාක්ෂණ අංශයක් හා පුහුණු සේවකයින් නොමැති අතර, විධිමත් අභ්‍යන්තර පාලන පද්ධති උපක්‍රම ද හඳුන්වා දී නොතිබුණි. පරිගණකගත ගිණුම්කරණ පද්ධතියට සමගාමීව ලෙජර් පොත් පත් අතින් ලියා සැකසීම 2020 වර්ෂයේ සිටම නතර කර දමා තිබූ අතර, 2021 ඔක්තෝම්බර් මස වන විටද 2019 ගිණුම් වසරට අදාළව සංඛ්‍යා දත්ත එම පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමට හා ඉවත් කිරීමට එහි පැවති විශේෂ හැකියාව නිසා ලබා ගන්නා දත්ත හා තොරතුරු වල විශ්වාසනීයත්වය පිළිබඳ ගැටළු ඇති වී තිබුණි. තවද, දත්ත වල අමතර පිටපත් (Backup) ආරක්ෂිතව තබා නොගැනීමත්, අවශ්‍ය විටක ඒවා යළි පද්ධතියට ඇතුළත් කළ නොහැකි වීමත්, පද්ධතිය සඳහා කාර්යක්ෂම දෘඩාංග ලබා නොගැනීමත්, අභ්‍යන්තර හා බාහිර විගණන අංශ වෙත පද්ධතියට පිවිසීමට අවස්ථාව සීමා වීමත් මත පරිගණකගත ගිණුම්කරණ පද්ධතිය අවදානම් තත්ත්වයක පැවතුණි. | නිරීක්ෂණ නිවැරදි වන අතර, ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නිවැරදි කිරීමටත්, අවශ්‍ය පද්ධති පාලන උපක්‍රම ක්‍රියාත්මක කිරීමටත්, මාණ්ඩලික නිලධාරීන් පුහුණු කිරීමටත්, ආරක්ෂක උපකරණ මිලදී ගැනීමටත් කටයුතු කරමි. | ආයතනය තුළ ගිණුම් තැබීමට භාවිතා කරන "Quick Book" වැඩසටහන භාවිතයේදී, පුහුණුව සහ අභ්‍යන්තර පාලන උපක්‍රම සහිතව අදාළ විගණන විමසුම මඟින් පෙන්වාදුන් නිරීක්ෂණ නිවැරදි කර එය භාවිතා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,139,436 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.31,235,609 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.30,096,173 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට චිත්‍රපට බෙදාහැරීමේ ආදායම් පෙර වසරට සාපේක්ෂව මෙම වසරේ රු.31,617,442 කින් එනම්, සියයට 67 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළ රු.90,000,000 ක් භාණ්ඩාගාර ලැබීම් හේතුවෙන් සංස්ථාවේ සමස්ථ මෙහෙයුම් අලාභය ආවරණය වී රු.1,139,436 ක අතිරික්තයක් ඇති වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 ජනවාරි මස සිට 2015 දෙසැම්බර් මස දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ජීවන වියදම් දීමනාව නොසලකා සේවක අර්ථ සාධක හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් ගණනය කර ගෙවීම නිසා එම අරමුදල් සඳහා පිළිවෙලින් රු.20,352,762 ක් සහ රු.2,763,752 ක් අඩුවෙන් දායක මුදල් ගෙවීම් කර තිබුණි. එම හිඟදායක මුදල් යළි ගෙවීමේදී ඒ සඳහා අධිභාර මුදල්ද ගෙවීමට සිදුවී තිබූ අතර, හිඟ මුදල් ගෙවීම සඳහා 2020 ඔක්තෝම්බර් 21 දින පැවති 1193 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එකඟතාවය ලබා දී තිබුණි. ඒ අනුව එකතුව රු.34,674,771 ක් වූ මෙම අධිභාර හා දායක මුදල් 2021 ජූනි 28 දින වන විට ගෙවා අවසන් කර තිබූ අතර, ඒ අනුව අධිභාර ලෙස එකතුව රු.11,558,257 ක් වූ අනාර්ථික වියදමක් සංස්ථාවට දැරීමට සිදු වී තිබුණි. | ජීවන වියදම් දීමනාව නොසලකා EPF සහ ETF ගණනය කර වාරික මුදල් ගෙවීම නිසා මෙම අධිභාර ගෙවීමට සිදුව ඇත. 2019 පෙබරවාරි 11 දින මෙම හිඟ මුදල් ගෙවීම ආරම්භ කර 2021 ජූනි 27 දින සියලු හිඟ මුදල් ගෙවා අවසන් කර ඇත. | EPF සහ ETF වාරික මුදල් ගණනය කිරීමේදී නිවැරදිව ගණනය කර වාර්තා යැවීමටත්, ඒ සඳහා වන ගෙවීම් නිවැරදි දිනට සිදු කිරීමටත් එමගින් අධිභාර වළක්වා ගැනීමටත් ක්‍රියා කළ යුතුය. |

**3.2** **හඳුනාගත් පාඩු**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව භාරයේ මෝටර් කාර් රථ 09 ක්, ඩබල් කැබ් රථ 02 ක්, වෑන් රථ 02 ක්, ලොරි රථයක් ඇතුළුව වාහන 14 ක් තිබුණි. එම වාහන අතරින් වාහන 07 ක්ම 2020 වර්ෂයේ පළමු කාර්තුව වන විට ධාවනයෙන් ඉවත් කර තිබූ අතර, ලොරි රථය 1998 වර්ෂයේ සිටම ධාවනයෙන් ඉවත් කර තිබුණි. සංස්ථා භූමිය තුළ ඉතා අනාරක්ෂිතව ගාල් කර පවතින මෙම සියළු රථ වාහන අළුත්වැඩියා කර පරිහරණය කිරීමට හෝ චක්‍රලේඛ ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු නොකිරීම නිසා 2021 ඔක්තෝම්බර් මස වන විටත් සංස්ථා භූමිය තුළ විවිධ ස්ථානවල ගාල් කර දිරාපත් වෙමින් තිබුණි. | මේ පිළිබඳව අවධානය යොමු කර ඉදිරියේදී සංස්ථාව සතු සියළුම වාහන සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් ලබාගෙන ඊට අනුකූලව කටයුතු කරනු ලැබේ. | පරිහරණය නොකරනු ලබන සහ අළුත්වැඩියා කළ නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු අතර, අළුත්වැඩියා කළ හැකි වාහන අළුත්වැඩියා කර ධාවනයේ යෙදිය යුතුය. |
| (ආ) 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.870,659 ක් වූ දල සේයාපට සහ රසායන ද්‍රව්‍ය තොගය 2014 වර්ෂයේ සිට කාලය ඉකුත් වීම සහ වර්තමානයේ භාවිතා නොකිරීම නිසා ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක පැවති අතර, පූර්ව වර්ෂයේ විගණකාධිපති වාර්තාව තුළද පෙන්වාදී තිබුණත්, ඊට අදාළව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | මෙම ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ පිළිබඳ නිවැරදි තොරතුරු භාණ්ඩ සමීක්ෂණ වලදී හඳුනාගෙන ඒවා එම සමීක්ෂණ මණ්ඩල කමිටු තීරණ අනුව හා පවත්නා නීති රීති අනුව ඉවත් කළ යුතුය. |
| (ඇ) සංස්ථාවේ ප්‍රධාන ගබඩාවෙහි පැවති වර්ෂ 05 ඉක්ම වූ චිත්‍රපට සහරා 7,917 ක ප්‍රමාණයක් අලෙවි කිරීමකින් තොරව ඉවත් කිරීමට කටයුතු නොකිරීම මත දිරාපත් වෙමින් පැවතුණි. තවද, කාලය ඉකුත් වූ සහ වර්තමානය වන විට ප්‍රයෝජනයට නොගන්නා භාණ්ඩා වර්ග 450 ක් පමණ ගබඩාවේ ඉඩකඩ අහුරාලමින් තබා තිබුණි. තවද, එම තොගයේ පිරිවැය හෝ වර්තමාන අගය සංස්ථාවේ ලේඛනවල සටහන් කර නොතිබුණි. පූර්ව වර්ෂ වාර්තාව මඟින්ද පෙන්වා දුන් මෙම ගැටළුව නිරාකරණය කිරීමට පියවරගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | මෙම ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ පිළිබඳ නිවැරදි තොරතුරු භාණ්ඩ සමීක්ෂණ වලදී හඳුනාගෙන ඒවා එම සමීක්ෂණ මණ්ඩල කමිටු තීරණ අනුව හා පවත්නා නීති රීති අනුව ඉවත් කළ යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2019 සහ 2020 වර්ෂ වලදී අභ්‍යන්තර විගණන විමසුම් 28 ක් නිකුත් කර තිබූ අතර, 2021 ඔක්තෝම්බර් 31 දින වන විටත් එක් විගණන විමසුමක් සඳහා පමණක් පිළිතුරු ලබාදීම නිසා සංස්ථාවේ ඉහළ කළමනාකරණය අභ්‍යන්තර විගණනය ආයතනයේ පාලන හා කළමනාකරණය සඳහා ඵලදායී ලෙස භාවිතා නොකරන බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය පිළිගනිමි. | අභ්‍යන්තර විමසුම් සඳහා පිළිතුරු ලබාදීමටත්, එමඟින් නිරීක්ෂණය වූ කරුණු නිවැරදි කිරීමටත් පියවර ගත යුතුය. |
| (ආ) 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද, සංස්ථාව විසින් ජංගම ගිණුම් 08 ක් පවත්වාගෙන ගොස් තිබූ අතර, එදිනට එම ජංගම ගිණුම්වල මුදල් පොත අනුව එකතුව රු.23,030,540 ක වාසිදායක බැංකු ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණි. ඒ අනුව එකතුව රු.මිලියන 23 ක් පමණ සංස්ථාව සතු මුදල් නිශ්කාර්යයාව රඳවා තබා ගැනීම මූල්‍ය කළමනාකරණයේ අකාර්යක්ෂමතාවයක් බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය නිවැරදිය. | ජංගම ගිණුම් තුළ පවතින වාසිදායක ශේෂ ඵලදායී ලෙස කෙටිකාලීනව ආයෝජනය කිරීමට හෝ ජංගම ගිණුම් තුළ වටිනාකමින් ඉහළ වාසිදායක ශේෂයක් දිගුකාලීනව පවත්වා නොගැනීමට කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |
| (ඇ) සංස්ථාවට අයත් අංක 224 දරන පරිශ්‍රයේ පිහිටි තනි මහල් ගොඩනැගිල්ල 2007 වර්ෂයේ සිටම ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය වෙත බදු කුළී පදනමට ලබාදී තිබුණි. දෙපාර්ශවය අතර අවසන් වරට 2017 ජනවාරි 23 දින අත්සන් කළ අංක 4711 දරන බදු ගිවිසුම 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණි. රැගුම් පාලක මණ්ඩලය විසින් එම බදු ගිවිසුමේ සඳහන් කොන්දේසි කඩකරමින් ගොඩනැගිල්ල කඩා ඉවත් කර වර්ග අඩි 2576 ක නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. එම නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ මූලික වැඩ 2016 මැයි 17 දින ආරම්භ කර තිබූ නමුත්, මේ දක්වාම ඉදිකිරීම් වැඩ නිම කර නොතිබුණි. විධිමත් ලිඛිත ගිවිසුමක් රහිතව රැගුම් පාලක මණ්ඩලය විසින් ඉදිකළ මෙම නව ගොඩනැගිල්ල සඳහා වන විදුලිය හා ජල බිල්පත් ඔවුන් විසින්ම තම ආයතනයේ නමින් | නීති නිලධාරියෙකු සංස්ථාවේ නොමැති අතර, මෙම කරුණ පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඉදිරියේදී පිළිතුරු ලබාදෙනු ඇත. ඉදිකිරීම් වලට අදාළ සත්‍ය පිරිවැය ලබා ගැනීමට නොහැකි වීම මත විධිමත් ගිවිසුමකට එළඹීමට මේ දක්වා නොහැකි විය. | මෙම නිරීක්ෂණය පිළිබඳව සොයා බලා ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත්, විධිමත් ලිඛිත ගිවිසුමකට කඩිනමින් එළඹීමටත්, හිඟ මුදල් අයකර ගැනීමටත්, සංස්ථාව සතු සියළු වත්කම් ආරක්ෂා කිරීමටත් කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගෙවීම් කරමින් ගොඩනැගිල්ල පරිහරණය කරනු ලබන බව නිරීක්ෂණය විය. ගිවිසුම අවලංගු වී වසර 02 කුත් මාස 10 ක් ගතවී ඇතත්, නව ගොඩනැගිල්ල සඳහා රජයේ තක්සේරු වාර්තාවක් ලබාගෙන නව බදු කුළිය තක්සේරු කර විධිමත් බදු ගිවිසුමකට එළඹීමට සහ හිඟ මුදල් අයකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) සංස්ථාවට අයත් අංක 224 දරන පරිශ්‍රයේ පිහිටි දෙමහල් ගොඩනැගිල්ලේ පළමු මහළ අංක 4660 දරන බදු ගිවිසුම ප්‍රකාරව 2019 ජනවාරි 14 දින දක්වා මසකට රු.315,000 ක බදු කුළී පදනමක් මත සංස්ථාව විසින් සැලසිනේ රූපවාහිනී ආයතනය වෙත ලබාදී තිබුණි. සිනමා පාසලක් පිහිටුවීමට 2021 දෙසැම්බර් 21 දිනැති අංක 1195 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව එන්තරවාසියක් යොමු කර සැලසිනේ ආයතනය ගොඩනැගිල්ලෙන් ඉවත් කිරීමට තීරණය කර තිබුණි. සැලසිනේ ආයතනය විසින් මේ දක්වා සංස්ථාවට අයවිය යුතු හිඟ බදු කුළිය, ජල හා විදුලි බිල්පත් එකතු වටිනාකම රු.4,111,810 ක් විය. සිනමා පාසලක් ආරම්භ කිරීමට යෝජිත මෙම ගොඩනැගිල්ල මෙම වාර්තාවේ දින දක්වා සංස්ථාව වෙත භාර දීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත | සංස්ථාවේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව අදාළ බදු ගැණුම්කරු ඉවත් කිරීමට හෝ තබා ගැනීමටත්, ඉවත් කරන තුරු ලිඛිත ගිවිසුමකට එකඟව ගොඩනැගිල්ල පරිහරණයට ලබා දීමටත්, හිඟ මුදල් බදු ගැණුම්කරු ඉවත් කිරීමට ප්‍රථම කඩිනමින් අයකර ගැනීමටත් ගිවිසුම් අත්සන් කළ පාර්ශවයක් ලෙස සංස්ථාව ඉහළ කළමනාකරණය අදාළ ගිවිසුම් ක්‍රියාවේ යෙදවීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) අයවිය යුතු හිඟ ණය ශේෂ වාර්තාව අනුව 2020 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට නිෂ්පාදනයට සහ සිනමාශාලා නවීකරණය සඳහා සංස්ථාව විසින් ලබාදී ඇති අයකර නොගත් මුළු හිඟ හිටි එකතු වටිනාකම රු.85,174,055 ක් විය. එම වටිනාකම තුළ ප්‍රදර්ශනය සඳහා මුදා නොහළ චිත්‍රපට සඳහා ලබාදී තිබූ අයකළ නොහැකි එකතුව රු.23,983,079 ක මුදලක් ද විය. ඒ අනුව චිත්‍රපට නිෂ්පාදනය, සිනමාශාලා නවීකරණය සහ වර්ග නොකළ නිෂ්පාදන ණයගැතියන් සඳහා ලබාදී තිබූ එකතුව රු.85,174,055 ක වටිනාකමින් එකතුව රු.72,712,671 ක් එනම් සියයට 85.4 ක් අයකරගත නොහැකි හිඟ ණය සහ පොළී මුදල් බව නිරීක්ෂණය වූ අතර, එම මුදල් අයකර ගැනීමට දිගු කාලයක සිට අපොහොසත් වී තිබුණි. | චිත්‍රපට නිෂ්පාදන ණය අයකර ගැනීමේ එකම මූලාශ්‍රය චිත්‍රපට ප්‍රදර්ශන ආදායමයි. 2020 වර්ෂය තුළ වැඩි කාලයක් සිනමාහල් වසා තිබූ බැවින් චිත්‍රපට ප්රදර්ශනය වී නොමැත. | ණය ලබාදීම, ණය ලිපිගොණු පවත්වා ගැනීම, ණය ගිවිසුම් හා ණය වාරික හා පොළී අයකර ගැනීම පිළිබඳ වූ ක්‍රියාවලිය ඉහළ කළමනාකරණය විසින් විධිමත් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතු අතර, හිඟ හිටි පැරණි ශේෂ අයකර ගැනීමට සහ ඒවා නිරවුල් කිරීමටත් දැඩි පාලන උපක්‍රම අනුගමනය කිරීමටත්, පැරණි ශේෂ හැර ඉදිරියේ දෙනු ලබන මුදල් සහ සේවා මත ණයගැති ශේෂ බොල් ණය නොවී අයකර ගැනීමටත් ඉහළ කළමනාකරණය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) සංස්ථාව විසින් රාජ්‍ය ව්‍යවසායක කාරක සභාව(COPE කමිටුව) වෙත ඉදිරිපත් කළ හිඟ ණය ශේෂ වාර්තාව අනුව සිනමාශාලා වලින් සංස්ථාවට අයවිය යුතු හිඟ මුදල් අතුරින් 2020 දෙසැම්බර් 31 දිනට අයකරගත නොහැකි යැයි අපේක්ෂිත එකතු වටිනාකම රු.284,502,137 ක් වන අතර, එය සිනමාශාලා වලින් අයවිය යුතු මුළු හිඟ මුදල් එකතු වටිනාකමින් සියයට 73 ක් විය. තවද, අපේක්ෂිත අයකරගත හැකි හිඟ මුදල් එකතු වටිනාකම රු.102,839,035 ක් වූ අතර, එම අගය මුළු හිඟ මුදල් එකතු වටිනාකමින් සියයට 27 ක් බව නිරීක්ෂණය විය. මෙම මුදල්ද අයකර ගැනීමට ඉහළ කළමනාකරණය අපොහොසත් වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ සිනමාශාලා වසා ඇති බැවින් මෙම මුදල් අයකර ගැනීමට නොහැකි වී ඇති අතර, ඒවා සාමාන්‍ය තත්ත්වයෙන් ක්‍රියාත්මක වීමෙන් පසුව මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | ණය ලබාදීම, ණය ලිපිගොණු පවත්වා ගැනීම, ණය ගිවිසුම් හා ණය වාරික හා පොළී අයකර ගැනීම පිළිබඳ වූ ක්‍රියාවලිය ඉහළ කළමනාකරණය විසින් විධිමත් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතු අතර, හිඟ හිටි පැරණි ශේෂ අයකර ගැනීමට සහ ඒවා නිරවුල් කිරීමටත් දැඩි පාලන උපක්‍රම අනුගමනය කිරීමටත්, පැරණි ශේෂ හැර ඉදිරියේ දෙනු ලබන මුදල් සහ සේවා මත ණයගැති ශේෂ බොල් ණය නොවී අයකර ගැනීමටත් ඉහළ කළමනාකරණය කටයුතු කළ යුතුය. |
| (උ) 2001 වර්ෂයේදී සිනමාහල් මණ්ඩල වලට බෙදී යාමේදී කිසිඳු මණ්ඩලයකට අදාළ නොකර, වසා දමන ලද සිනමාශාලා 137 කින් 2020 දෙසැම්බර් 31 දිනටද අයවිය යුතු වර්ෂ 19 කට වඩා පැරණි හිඟ මුදල් එකතු වටිනාකම රු.7,659,366 ක් විය. තවද, මණ්ඩල වලට බෙදීමෙන් පසුව 2020 දෙසැම්බර් 31 දක්වා වසා දමන ලද සිනමාශාලා වලට අදාළව අයවිය යුතු මුළු හිඟ මුදල් එකතු වටිනාකම රු.138,022,871 ක් වූ අතර, ඒ අනුව එකතුව රු.145,802,930 ක් වසා දමන ලද සියළු සිනමාශාලා වලින් අයකර ගත නොහැකිව හිඟව පැවතුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. | මෙම වසා දමන ලද සිනමාශාලා වලින් ඉතා දිගුකාලයක සිට අය කළ නොහැකි ශේෂය බොල් ණයක් වන අතර, එම ශේෂ පිළිබඳව වැඩිදුර පරීක්ෂා කර එම ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ඌ) 2020 දෙසැම්බර් 31 දිනට සියළුම සිනමා ප්‍රදර්ශන මණ්ඩල වලට අයත්ව ක්‍රියාත්මක වන සිනමාශාලා වලින් අයවිය යුතු මුළු ණය හා පොළී මුදල් එකතුව රු.241,538,242 ක් විය. එම මුදලින් එකතුව රු.136,881,529 ක් පොළී මුදල වන අතර, එකතුව රු.104,656,713 ක් හිඟ මුදල් විය. එකතුව රු.241,538,242 ක් වූ මුළු වටිනාකමින් එකතුව රු.142,046,109 ක් එනම්, සියයට 58 ක් අයකරගත නොහැකි හිඟ මුදල් හා පොළී වන බව ණය වාර්තාව අනුව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය නිවැරදි වේ. | ණය ලබාදීම, ණය ලිපිගොණු පවත්වා ගැනීම, ණය ගිවිසුම් හා ණය වාරික හා පොළී අයකර ගැනීම පිළිබඳ වූ ක්‍රියාවලිය ඉහළ කළමනාකරණය විසින් විධිමත් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතු අතර, හිඟ හිටි පැරණි ශේෂ අයකර ගැනීමට සහ ඒවා නිරවුල් කිරීමටත් දැඩි පාලන උපක්‍රම අනුගමනය කිරීමටත්, පැරණි ශේෂ හැර ඉදිරියේ දෙනු ලබන මුදල් සහ සේවා මත ණයගැති ශේෂ බොල් ණය නොවී අයකර ගැනීමටත් ඉහළ කළමනාකරණය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඵ) සේවක ණය අත්තිකාරම් ගෙවීම් හා අයකර ගැනීම සම්බන්ධයෙන් වූ පද්ධතියෙහි වූ පාලන දුර්වලතාවයන් නිසා 2020 දෙසැම්බර් 31 දිනට හඳුනාගත නොහැකිවූ ණය අත්තිකාරම් ශේෂය රු.539,222 ක් විය. තවද, වර්ෂ 05 ඉක්ම වූ අයකර නොගත් ණය අත්තිකාරම් රු.531,420 ක්ද, අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. | පිළිතුර මඟින් සඳහන්ව ඇති පරිදි මෙම ණය අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඒ) නොගෙවූ වැටුප් ගිණුම තුළ 2001 වර්ෂයටත් පෙර සිට හඳුනා නොගත් නොගෙවූ වැටුප් එකතුව රු.387,231 ක් ඇතුළුව, වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.1,331,443 ක් වූ නොගෙවූ වැටුප් හඳුනාගෙන අදාළ පුද්ගලයන් වෙත ගෙවීමට හෝ නැවත ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. | නොගෙවූ වැටුප් හඳුනාගෙන නැවත අදාළ පුද්ගලයන්ට ගෙවීමට හෝ නැවත ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කළ අංක:DMS/360/NFC/P හා 1999 ජූනි 17 දිනැති “ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා ඒ පිළිබඳ මාර්ගෝපදේශය” ප්‍රකාරව (නීලවීර වාර්තාව) සංස්ථාව සතුව තිබූ චිත්‍රපට බෙදා හැරීමේ ඒකාධිකාරී බලය පෞද්ගලික බෙදාහැරීමේ මණ්ඩල 04 ක් වෙත පවරා දී තිබුණි. එම මණ්ඩල චිත්‍රපට බෙදා හැරීමේ ක්‍රමවේදය සාධාරණ ලෙස සිදු නොකිරීම නිසා 2020 මාර්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 20/0581/205/019 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් “නීලවීර වාර්තාව” අහෝසි කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. එම තීරණයට පෞද්ගලික මණ්ඩල විසින් ගනු ලැබූ නෛතික ක්‍රියාමාර්ගයන් නිසා සංස්ථාව විසින් සකස් කළ “චිත්‍රපට බෙදා හැරීම සහ ප්‍රදර්ශනයට අදාල ක්‍රමවේදය” විධිමත්ව කැබිනට් අනුමැතියක් සඳහා යොමු කර තිබූ අතර, එම බෙදා හැරීම හා ප්‍රදර්ශනයට අදාල ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා 2021 ජූනි 14 දිනැති අංක:අමප/21/1024/305/022 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණි. එම අනුමැතිය ප්‍රකාරව එහි සඳහන් කරුණු මේ දක්වා ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු නොකිරීම නිසා සංස්ථාවේ ක්‍රියාකාරිත්වයට සහ චිත්‍රපට කර්මාන්තයේ අභිවෘධියට අයහපත් ලෙස බලපෑම් ඇති කර තිබුණි. | පිළිතුරු ලබාදී නැත. | සංස්ථාවේ අභිවෘද්ධිය සඳහා 2021 ජූනි 14 දින අමාත්‍ය මණ්ඩලය ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාවේ යෙදීමටත්, ඒ සඳහා වන ගැසට් පත්‍රය නිකුත් කිරීමටත් ඉහළ කළමනාකරණය ක්‍රියා කිරීමට සුදුසු වේ. |

| | | |
|---|---|---|
| (ඕ) සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් දෙදෙනකු ඇතුළුව සංස්ථාවේ නිලධාරීන් හා සේවකයින් කිහිප දෙනෙකු වෙනුවෙන් විනය පරීක්ෂණ සහ අධිකරණ ක්‍රියාමාර්ග වලට පාලන අධිකාරිය විසින් එලඹී තිබුණි. පවත්නා නීති රීති, චක්‍රලේඛ සහ ආයතන සංග්‍රහය ප්‍රකාරව මෙම පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් නොකිරීම නිසා සංස්ථාවේ ඉහළ තනතුරුවල ස්ථිරව තනතුරු දරන නිලධාරීන් නොමැති අවස්ථා නිරීක්ෂණය වූ අතර, එය සංස්ථාවේ ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපෑම් ඇතිකර තිබුණි. | ආයතනය ප්‍රමාදයට හේතු දක්වමින් දීර්ඝ පිළිතුරක් ලබාදී ඇත. තවද, පරීක්ෂණ ප්‍රමාදයට විවිධ හේතු දක්වා ඇත. කඩිනමින් පරීක්ෂණ අවසන් කරන බවද සඳහන් කර තිබුණි. | 2021 ජූලි 19 දින පැවති රාජ්‍ය ව්‍යවසායක කාරක සභා උපදෙස් ප්‍රකාරව මෙම පරීක්ෂණය කඩිනමින් අවසන් කර සේවක ගැටලු අවම කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ක) 2021 ජූලි 19 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා කමිටු රැස්වීම් වාර්තාව ප්‍රකාරව 2021 අගෝස්තු 05 දින “කෝප්” කමිටුව මඟින් අංක COPE/9/1/2020 දරන ලිපිය සමඟ කමිටු නියෝග 14 ක් සංස්ථාව වෙත යොමු කර තිබුණි. නිශ්චිත කාල වකවානු සඳහන් කරමින් ලබාදී තිබූ එම නියෝග වලට අනුකූලව පවරන ලද කාර්යයන් 10 ක් මෙම වාර්තාවේ දින දක්වා නිම කර එහි සඳහන් උපදෙස් ප්‍රකාරව කෝප් කමිටුව වෙත සහ විගණකාධිපතිවරයා වෙත වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | 2021 ජූලි 19 දින දරන කෝප් කමිටු රැස්වීම් වාර්තාව අනුව 2021 අගෝස්තු 05 දින දරන ලිපියෙන් ලබාදුන් කමිටු නියෝග අනුව ඉහළ කළමනාකරණය කටයුතු කළ යුතුය. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂය සඳහා ආයතනය ක්‍රියාකාරීත්වය හා ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. ඒ අනුව විගණනයට ඉදිරිපත් කළ 2020 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව තුළ ඇතුළත් කර ඇති කාර්යයන් ඉටු කිරීමේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය විගණනයේදී නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | 2020 වසරේ පැවති කොවිඩ් තත්ත්වය හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කිරීමට අපහසු විය. | ක්‍රියාකාරී සැලැසුම් සකස් කර, සැලැස්මට අනුකූලව ආයතනයේ කටයුතු ක්‍රියාත්මක කර කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා කළමනාකරණය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) උසස් ශ්‍රී ලංකේය සිනමා සංස්කෘතියක් බිහි කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ශාස්ත්‍රීය, සංකල්පීය සහ තාක්ෂණික පදනමක් සකස් කිරීමේ අරමුණු පෙරදැරි කරගෙන සිනමාකරණය පිළිබඳ එක් අවුරුදු “ඩිප්ලෝමා පාඨමාලාවක්” ආරම්භ කර තිබුණි. අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක වන මෙම පාඨමාලාව සඳහා 2020 වර්ෂයේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් 50 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද, සිසුන් බඳවාගෙන නොතිබුණි. යල්පැන ගිය උපකරණ භාවිතා කිරීමත්, තාක්ෂණික උපකරණ ප්‍රමාණවත් නොවීමත්, නවීන ශ්‍රවනාගාර පහසුකම් නොමැති වීම මත පාඨමාලාවට අයදුම් කරන සංඛ්‍යාව පහළ ගොස් තිබූ අතර, 2016 වසරේ සිට 2020 දෙසැම්බර් දක්වා වූ වර්ෂ 05 තුළ සිසුන් 94 දෙනෙකු බඳවාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට ශිෂ්‍යයින් 22 දෙනෙකු එනම්, සියයට 23 ක් පමණක් පාඨමාලාව සම්පූර්ණ කර තිබුණි. | මෙම පාඨමාලාව සඳහා බඳවා ගන්නා සිසුන්ගෙන් සියයට 50 ක් පමණක් එය සම්පූර්ණ කරන අතර, පාඨමාලාවට උපකරණ ඉල්ලුම් කර ඇතත්, එය සැපයීමට නොහැකි වී ඇත. අවශ්‍ය උපකරණ ඉල්ලුම් කර ඇත. | මෙම ඩිප්ලෝමාව සඳහා බඳවා ගන්නා පිරිස අතුරින් එය සම්පූර්ණ කරන සංඛ්‍යාව ඉහළ නැංවීමත්, ගුණාත්මක හා දක්ෂ ඩිප්ලෝමාධාරීන් බිහිකිරීමටත් සංස්ථාව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 4 (ඌ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිටත චිත්‍රපට සම්බන්ධයෙන් වෙළඳපොළ පර්යේෂණ පැවැත්වීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේදී ලාංකේය සිනමාව සම්බන්ධයෙන් වෙළඳපොල පර්යේෂණ සිදු කිරීමට අපේක්ෂිතය. | 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 4 (ඌ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2006 ජනවාරි 25 දිනැති ජා.ප්‍ර.නි. චක්‍රලේඛ අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලිය භාවිතා කිරීමකින් තොරව එකතු වටිනාකම රු.99,965,061 ක් වූ ගොඩනැගිලි ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් 2019 අප්‍රේල් 05 දින සංස්ථාව විසින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ප්‍රදානය කර තිබුණි. ඒ සඳහා දෙපාර්ශවය අතර අත්සන් කළ ද්විපාර්ශවික ගිවිසුම මත පදනම්ව 2020 අගෝස්තු 28 දින එකතුව රු.3,134,107 ක් ප්‍රසම්පාදන ක්‍රමවේදයට | විගණන විමසුමෙහි 05 සහ 07 නිරීක්ෂණය නිවැරදි වේ. 06 මෙම ඉදිකිරීම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් සිදු කරන ලදී. මෙම අක්‍රමිකතාවය පිළිබඳ අභ්‍යන්තර විමර්ශණයක් ආරම්භ කර ඇති බැවින් එහි තීන්දු ප්‍රකාරව නිශ්චිත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| පරිබාහිරව තෝරාගත් කොන්ත්‍රාත්කරු වූ රාජ්‍ය සංස්ථාවක් වෙත ගෙවීම් කර තිබූ අතර, මේ දක්වාම මෙම ඉදිකිරීම් අතරමඟ නතර කර දමා තිබුණි. | | |
| (ආ) සංස්ථාවට අයත් ''තරංගනී'' සිනමාශාලාව සඳහා 4K ප්‍රොජෙක්ටරයක් එකතුව රු.11,460,155 ක් ගෙවා මිලදීගෙන තිබුණි. මෙම මිලදී ගැනීමට අදාළ ලිපිගොණු විධිමත්ව හා විනිවිද භාවයකින් යුතුව පවත්වාගෙන ගොස් නොතිබූ අතර, එම මිලදී ගැනීම 2006 ජනවාරි 25 දිනැති ජා.ප්‍ර.නි. චක්‍රලේඛ අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් සිදු කර නොතිබුණි. 2020/ 2021 වර්ෂ වන විට සංස්ථාවට අයත් ''තරංගනී'' සිනමාශාලාවේ භාවිතය සඳහා සවිකර තිබූ මෙම ප්‍රොජෙක්ටරය සවි කිරීමෙන් පසුව අවස්ථා කීපයකදී අක්‍රිය වී තිබූ අතර, වර්තමානය වන විටද එය ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණි. | පිළිතුරු දී නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 186 ක් වූ අතර, එම අනුමත තනතුරු වලින් තනතුරු 129 ක් සඳහා සේවකයින් බඳවාගෙන අනුයුක්ත කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු වලින් තනතුරු 57 ක් පුරප්පාඩු වී පැවති අතර, එම පුරප්පාඩු අතරින් තනතුරු 12 ක් සඳහා දැනට සංස්ථාවේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු වැඩබැලීම, රාජකාරි ඉටු කිරීම හා රාජකාරි ආවරණය කිරීම වැනි පදනමක් මත සේවයේ යොදවා තිබුණි. සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් පැවති අතර, එම ප්‍රධාන තනතුරු 03 න්, තනතුරු 02 ක් සඳහා ස්ථිර නොවන ද්විතීයික හා වැඩබලන පදනම මත නිලධාරීන් පත් කර සේවයේ යොදවා තිබුණි. මෙම සේවක පුරප්පාඩු සහ ස්ථිර පදනම මත සේවයට බඳවා නොගැනීම සංස්ථාවේ කාර්ය සාධනයට සහ ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපා තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි. සංස්ථාවේ පිරිස්බල තක්සේරුවක් සිදු කර සංවිධාන ව්‍යූහය හා බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය කිරීමට කමිටුවක් 2021 අගෝස්තු 10 දින පත් කර එම කාර්යය සිදු කරමින් පවතී. | ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා අත්‍යාවශ්‍ය තනතුරු සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවාගෙන සේවයේ යෙදවීමට ක්‍රියා කළ යුතු අතර, පිළිතුරු ප්‍රකාරව කාලීන අවශ්‍යතාවය මත කාර්යය මණ්ඩලය හඳුනාගෙන ගැටළු නිරාකරණය කිරීම සුදුසු වේ. |

| | | |
|---|---|---|
| (ආ) සංස්ථාවේ බඳවාගැනීම් පරිපාටිය සඳහා 2012 සැප්තැම්බර් 14 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලැබී තිබුණි. එය අනුමත කර ඉතා දීර්ඝ කාලයක් ගතවී තිබුණද, කාලීන අවශ්‍යතා මත සුදුසුකම් හා බඳවා ගැනීමේ ක්‍රමවේදයන් සංශෝධනය කර නොගැනීමත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පොදු සංශෝධන ඊට ඇතුළත් කර එම දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගැනීමත් නිසා සේවකයින් බඳවා ගැනීමේ ගැටළු ඇති වී තිබූ අතර, එය ආයතනයේ දිගුකාලීන පැවැත්මට සහ කළමනාකරණයේදී අහිතකර ලෙස බලපා තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි. | කාලීන අවශ්‍යතා මත බඳවා ගැනීමේ ක්‍රමවේදය සංශෝධනය කිරීමටත්, ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමටත් ක්‍රියා කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ වාර්ෂික වාර්තාවන් 2021 ඔක්තෝම්බර් මස දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා වාර්ෂික වාර්තාව සකස් කර එවකට පැවති රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. අමාත්‍යාංශ විටින් විට වෙනස් වීම හේතුවෙන් මෙම වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොමැති අතර, ඒ පිළිබඳව සොයා බලා එම වර්ෂවල වාර්තා සහ 2018, 2019 වර්ෂවල වාර්ෂික වාර්තා සභාගත කිරීමට කටයුතු කරමි. | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වන වාර්ෂික වාර්තා අප්‍රමාදව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |

**4.2 සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දින හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2020 – 2025 කාල පරිච්ඡේදය සඳහා සකස් කළ උපාය මාර්ගික සැලැස්ම සඳහා 2021 ජූලි 19 දින වන විටත් අධ්‍යක්ෂ මණ්ඩල | විගණන නිරීක්ෂණය පිළිගනිමි. | 2003 ජූනි 02 දින හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලසුම් සකස් කර අනුමැතිය ලබාගෙන ඒ අනුව ක්‍රියා කළ යුතුය. |

අනුමැතියක් ලබාගෙන නොතිබූ අතර, පසුව 2021 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 03 ක් සඳහා උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීමට තීරණය කර තිබුණද, 2021 ඔක්තෝම්බර් මස දක්වා එම සැලැස්මද සකස් කර අනුමත කරගෙන නොතිබුණි.

### 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කළ අයවැය යටතේ සිනමා කර්මාන්තය දියුණු කිරීමට රු.460,000,000 ක්ද, සිනමා විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට රු.250,000,000 ක්ද, විද්‍යුත් ප්‍රවේශපත්‍ර ක්‍රමය සඳහා රු.50,000,000 ක් සහ සිනමා කෞතුකාගාරය සඳහා රු.90,000,000 ක් දැරීමට ඇස්තමේන්තු කර තිබුණි. යථෝක්ත කාර්යයන් ඉටු කර ගැනීමේදී නිරවද්‍ය සැලසුම් මත ප්‍රතිපාදන සලසා ගැනීමට නොහැකි වීමත්, රටපුරා කොවිඩ් 19 වසංගතය පැතිරී යාම මත ආදායම් මාර්ග බිඳ වැටීමත් නිසා එම ඉලක්ක කිසිවක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | 2021 වසරේදී නිවැරදිව සැලසුම් සකස් කරමි. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලසුම් සකස් කර ඒ අනුව ක්‍රියා කළ යුතුය. |

### 4.4 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 මාර්තු 24 දින සහ 2021 ජූලි 19 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා මහින්ද සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීමට උපදෙස් ලබාදී තිබුණි. සංස්ථාවේ හිටපු අභ්‍යන්තර විගණක 2020 වර්ෂයේදී විශ්‍රාම ගොස් තිබූ අතර, එම තනතුර සඳහා 2021 ඔක්තෝම්බර් මස දක්වා ස්ථිර නිලධාරියෙකු බඳවාගෙන නොතිබුණි. සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශයක් පැවතියද, එම අංශයේ එක් සේවිකාවක් සේවයේ යෙදවීම මත අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීමට කළමනාකරණය පියවරගෙන නොතිබුණි. | අභ්‍යන්තර විගණක 2020 සැප්තැම්බර් 09 දින විශ්‍රාම යන ලදී. පුරප්පාඩුව සඳහා නව නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කරමින් සිටී. | අභ්‍යන්තර විගණන අංශය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු බඳවාගත යුතු අතර, අංශය තුළ වර්තමානයේ එක් නිලධාරිනියක් පමණක් සේවය කරන බැවින් අවම වශයෙන් තවත් එක් සේවකයෙකුවත් සේවයේ යෙදීමට ක්‍රියා කළ යුතුය. |

**4.5 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| "තිරසර සංවර්ධනය පිළිබඳව වූ "එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සංස්ථාව විසින් තම විෂයය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. ඊට අදාළව ක්‍රියාත්මක කළ යුතු ඉලක්ක හා දර්ශක හඳුනාගෙනද නොතිබුණි. තවද, ඒ සඳහා වන කාර්ය සාධනය මැනීම සඳහා අවශ්‍ය වන නිරවද්‍ය දත්ත පදනමක් බිහිකර ගැනීමට අපොහොසත් වී තිබූ අතර, ඉලක්ක ලඟා කර ගැනීම සඳහා සූදානම් වීමට වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කරන බවටද සාක්ෂි නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි. | තිරසර සංවර්ධන පිළිබඳ ඉලක්ක හා දර්ශක පිහිටුවා එම ඉලක්ක ලඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |